# බලංගොඩ අධ්‍යාපන කලාපය

# නර්තනය - 7 ශ්‍රේණිය

## නිපුණතා මට්ටම - 4.1

## ක්‍රියාකාරකම - කුළු නැටුමේ ගායනා වල සමාජීය හා සංස්කෘතික පසුබිම

දේශීය ගැමි නැටුම් අතරින් වඩාත් ජනප්‍රිය නර්තන අංගයක් ලෙස කුළු නැටුම ජීවන වෘත්තීන්ටත් ගෘහස්ථ ක්‍රියාකාරකම් වලටත් සම්බන්ධ වී නිර්මාණය වූවකි.

මෙහි ප්‍රභවය සිදුවූයේ (ආරම්භය) 'ශාන්තිකර්ම නර්තන හේතුකොට ගෙන යැයි ඇතැමුන් සලකති.

ගොවිතැන් කටයුතු වලදී ප්‍රයෝජනයට ගන්නා කුල්ල කමත් බස් වහරට අනුව හඳුන්වනේන් 'යතුර නැමැති පාරිභාෂික පදයෙනි.

## කුල්ලෙන් කරන කාර්යයන්

- අස්වැන්න හෙවත් බැත පිරිසිදු කර ගැනීම
- කමත් කණුව මුල ගොඩ කරගන්නා බැත කාටුව පිස හැරීම (බැත ගොඩ මතට සුළං පහර වදින සේ කුල්ල දෙපසට වැනීම කාටුව හෙවත් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගොවීන් යොදානන්නා සරල ක්‍රමයයි
- වී හුළං කිරීම කරනු ලබන්නේ ද කුල්ලේ ආධාරයෙනි. ඒ සඳහා කතිර හැඩයට තනන ලද අට්ටාලයක් මතට නැග හමා එන සුළඟට වැදී බොල් වී ඈතට විසි වී ආසන්නයේ ගොඩ ගැසෙන ආකාරයට , කුල්ලෙන් ගත් වී ටිකෙන් ටික ක්‍රමානුකූල ව පහතට හෙළනු ලබයි.
- බොල් වී ඉවත් කොට පිරිසිදු කරගත් වී ගෝනි මලුවට පිරවීම කරනු ලබන්නේ ද කුල්ලේ ආධාරයෙනි.

- මෙහිදී කුල්ල පූජා භාණ්ඩයක් ලෙස සලකා බැත ගොඩ මත මුනින් නමා වැඳ නමස්කාර කොට එකී කාර්ය සඳහා යොදා ගැනීම සම්මත චාරිත්‍රයකි.

- ගෘහස්ත කටයුතු වලදී ද කුල්ල යොදාගන්නේ ,
  - වනේ කොටාගත් වී " පොලා" සහල් වෙන් කර ගැනීම
  - කඩ සහල් නැතහොත් ''සුන් සහල් වෙන් කර ගැනීමට පුහු කිරීම

- කමතේදි පිරිමි පාර්ශවය කුල්ල භාවිතා කරන අතර මුළුතැන්ගෙයි වැඩ කටයුතු වලදී එනම් වී පෙළීම , සහල් පෙලීම, සහල් පූ කිරීම ආදි කටයුතු වලදී කාන්තාවන් විසින් කුල්ල භාවිතා කරනු ලබයි.

- කුළු නැටුම සඳහා යොදාගන්නා කවි විවිධ තාල රූප හා විවිධ නාද මාලා අනුව සරල ගැමි බස් වහරකින් නිර්මාණය වී ඇත. එමෙන්ම මේ සඳහා රත්නමාලි දෙව්දුව සම්බන්ධ රන් තෙලඹු වර්ණාවේ එන කවි හා රත්නවල්ලි කවි ද යොදාගනු ලැබේ.

- රටා දමා කුල්ල සකස් කිරීම එහි එන සමහර ගායනා වලින් පැහැදිලි වේ.

| | |
|---|---|
| කැලේ ගොසින් බට පතුරු | කපන්නේ |
| පළා පුරුක් හැර අව්වේ | දමන්නේ |
| නමා දෙකොන මුළු අස්සේ | පුරන්නේ |
| රටා දමාලයි කුල්ල | වියන්නේ |

එසේ සකසා ගත් කුල්ල නර්තනයේ දි විවිධ සැරසිලි හා වර්ණ යොදා අලංකාර කර ගනියි.

කෘෂි කර්මාන්තයේදි කුල්ල භාවිතයට ගන්නා අවස්ථා ඉහතින් දක්වා ඇත.මෙකී කටයුතු වල යෙදෙන ආකාරය ඉතා විචිත්‍ර ලෙසත් නර්තනය මගින් නිරූපණය කිරීම කුළු නැටුමේ දි දක්නට ලැබේ.

මෙකී ක්‍රියාකාරකම් වලට අමතරව ස්ත්‍රී ලාලිත්‍යත් , ඔවුන්ගේ විනෝදශිලී හැසිරීමත් නිරූපණය කරන චලන පෙර කී ක්‍රියාකාරකම් නිරූපණය කරන චලන අතරට එක්

කර ගැනීම මඟින් ද රංඟ රටා හා විවිධ හැඩතල භාවිතයෙන් ද නර්තනයෙහි සුන්දරත්වය නැතහොත් ප්‍රාසාංගික ගුණය ඉස්මතු කරයි.

වර්තමානයේ ප්‍රසංග වේදිකාව සඳහා කුලු නැටුම නිර්මාණය කිරීමේදි සංකීර්ණ තාල රටා , මාත්‍රා (පද) හා රංඟ රටා යොදා ගනිමින් නර්තනය කරන අයුරු දක්නට ලැබේ.





ඉහත පිංතූර නිරීක්ෂණය කිරීමේදි කුල්ල භාවිතා කරමින් නර්තනය සිදු කරන අයුරු පෙනේ.

- ❖කුලු රැගෙන සබයට එන කාන්තාවෝ
- ❖කුල්ලෙන් වී හුළං කිරීම
- ❖කුල්ලට වී පිරවීම
- ❖අතින් අත මාරු කරගැනීම
- ❖වී පෙළීම , පූ කිරීම
- ❖පොලන ලද වී පසකට දැමීම
- ❖කාර්ය නිමා කිරීමේදි ලද සතුට

ආදි අවස්ථාවන් කුළු නැටුමක් නිර්මාණය කිරීමේදි යොදා ගත යුතුය.

කුළු නැටුමක් නිර්මාණයට පහත සඳහන් කවි ගායනා භාවිතයට ගත හැක.

## මාත්‍රා 3 තාලය

| | |
|---|---|
| ඈත සිටන් එන්නි සෙල්ලි | සෙල්ලියේ |
| මෑත සිටන් එන්නි සෙල්ලි | සෙල්ලියේ |
| අතේ පයේ ගිගිරිද සෙල්ලි | සෙල්ලියේ |
| කුළු සරඹෙට එනවද රත්න | වල්ලියේ |

| | |
|---|---|
| බන්දවාන කුළු යතුරු | තනාලා |
| ඇන්දවාන අළු යන්තරේ | ඇඳලා |
| කැන්දවාන දෙදෙනෙකුට | කියාලා |
| කන්ද බැදෙන බැත පැහැපත් | කරලා |

ළමා ලියෝ ගවසා මල් වරල | පිට
දමා කරට මුතු පොට අත වළලු | වට
පෙමා වඩන ලෙස සරසා ඔසරි | පොට
පමා නොව රඟන් කුළු ගෙන සබේ | පිට

## ක්‍රියාකාරකම

1. විවිධ තාල රූප අනුව කුළු කවි ගායනය කරන්න.
2. කුල්ල භාවිත කරමින් කුළු නැටුමට සුදුසු පද 4 ක් නිර්මාණය කරන්න.
3. විවිධ රංග රටා භාවිත කරමින් කුළු නැටුමක් නිර්මාණ කරන්න.

සැකසුම - සුමනා මාලිනි